# සිංහල සංස්කෘතිය තුළ දිවිරීම හා බැඳි අභිචාර විධි පිළිබඳ විමසුමක් (හොරොව්පොතාන, කපුගොල්ලෑව ඓතිහාසික දිවිරුම් දේවාලය ආශ්‍රිත අධ්‍යයනයක්)

*ගල්කුලමේ උපරතන හිමි* [1]

***ABSTRACT***

***Diureemä, the Sinhala word for swearing is done in order to confirm the truth of some statement made by a person. Among the Sinhalese community swearing is done in many ways 'saththai', 'ammapal', 'teviyampal', 'budumpal' are some example. Swearing is done with in judicial framework also. It is true that the word has a long history. According to 'Mahawansa', king Vijaya had sworn on the third breast of coven and promised to be loyal to her.***

***At present human beings have made a great progress industrially and they depend on the modern judicial system to resolve their disputes and they depend on the modern judicial their disputes and to get justice to resolve their disputes and to get justice done according to the Roman-Dutch law, which is practiced today. The judgments is mainly the given on the basis of evidence. However, the faith the Sri Lankan people have placed on traditional beliefs has not been diminished.Therefore, some people challenge the judgment given by the court of law and put faith in non- visible mysterious powers. Swearing is one such method. Just as our ancestors the modern Sinhala people too resort to swear in front of gods and bear the consequences instead of the verdict given by a court of law. The study problem in this article is examining why people believe in non- visible mysterious powers for a fair judgment inspite of having a very progressive and accepted judicial system in the country.***

[1] **Ven Galkulame Uparathana Thero, Lecturer (Prob) in Sinhala BA (Hons) RUSL, Department of Humanities. E-mail: upa071@gmil.com**

## හැඳින්වීම (Introduction)

දිව්රීම යන්න "දිව්" යන නාම ප්‍රකෘතියෙන් සැදුණු නාම පදයකි. "දිව්" යන නාම ප්‍රකෘතියෙන් සිංහලයට බිඳුණු වචන රැසකි. ඒ අතරින් දිව්රීම හා බැඳි වචන කිහිපයක් හඳුනාගත හැකිය. දිව්රුම්, දිවුරිලි, දිව්රීම, දිවු, දිව්රනවා ආදිය ඉන් සමහරකි (සිංහල ශබ්ද කෝෂය, 1985: 5338). කිසියම් පුද්ගලයෙකු විසින් කරනු ලබන ප්‍රකාශයක සත්‍යතාව වඩාත් තහවුරු කිරීම සඳහා දිව්රන අවස්ථා අප දැක ඇත්තෙමු. සත්තයි, අම්මාපල්, දෙවියන්පල්, බුදුන්පල්, ආදිය එබඳු දිව්රීමේ අවස්ථා කීපයකි. සාමාන්‍ය ව්‍යවහාරය තුළ දිව්රීම මෙබඳු ආකාරයෙන් සිංහල සමාජය තුළ පැවතුන ද නෛතික රාමුවක් තුළ සිට කරනු ලබන දිව්රීම් ද දක්නට ලැබේ. එබඳු අවස්ථා වලදී ඊට ආවේණික අභිචාර විධි රාශියක් ද දක්නට ලැබීම විශේෂත්වයකි.

"සුමංගල" ශබ්ද කෝෂයේ දිව්රනවා යන්නට දී ඇති අර්ථ විග්‍රහය වන්නේ,

"තමන් කියන දෙයෙහි සත්‍යතාව තහවුරු කිරීම සඳහා ගරු ගාම්භීරාකාරයෙන්, ප්‍රකාශයක් කරනවා, ශපථ කරනවා, දෙවියන් ආදී අති මානුෂ බලයක් ඇත්තකු හෝ ශුද්ධ වූ වස්තුවක්, ස්ථානයක් දෙස් වශයෙන් තබවා මෙය කරනු ලැබේ" වශයෙනි (සුමංගල ශබ්ද කෝෂය, 1963:).

ගුණසේන ශබ්ද කෝෂයට අනුව දිව්රුම යනු "තම ප්‍රකාශයේ සත්‍ය බව හෝ අවංක බව සහතික වශයෙන් කියා සිටීම, උත්තමයෙකුගේ නාමයෙන් කරන බරපතල සත්‍ය ප්‍රකාශය" වශයෙනි. "දිව්රුම" යන්න ඉංග්‍රීසි භාෂාවෙන් හැඳින්වෙන්නේ "SWEAR'' යනුවෙනි. "OATH'' යන්න ද ඊට ම සමාන අර්ථයේ යෙදී ඇති පදයකි. "OXFORD" ශබ්ද කෝෂයට අනුව "SWEAR'' යනු, "Appeal to a god or other sacred person or thing in confirmation of the truth of a solemn declaration or statement''(Brown,1997:3170).

දිව්රුම යන්න පාලියේ "සපත" යනුවෙන් ද දෙමළ භාෂාවේ "සත්තිය ප්‍රමාණම්" යනුවෙන් ද ව්‍යවහාර කෙරේ. ජනශ්‍රැති ශබ්ද කෝෂයට අනුව දිව්රීම හා සම්බන්ධ වචන රාශියකි. "දිවිසීට්ටුව" (දිව්රුම් ප්‍රකාශය සහිත ලියවිල්ල) දිවි දොස්, දිව්රුම් බෝධිය, දිව්රුම් පොළ (ලියනගේ, 2000: 258).

දිව්රුම සිංහලයට කවදා කොතැනින් පිවිසියේ දැයි නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකිය. එහෙත් ඊට දිගු ඉතිහාසයක් පවතින බව නම් සත්‍යයකි. විජය රජු කුවේණියගේ ළැමැද තනය ගිවිස්වා දිව්රුම් දුන් බව මහාවංශයේ සඳහන් වේ. (සුමංගල හිමි, දේවරක්ෂිත, 1996: 39). (කුවේණියගේ පියයුරු තුනක් තිබුණු බව සඳහන්, ඉන් මැද පියයුර අන්තර්ධාන වූ කළ ඇයට ස්වාමියෙකු ලැබෙන

බවට සෘෂිවරයෙකු ප්‍රකාශ කරන ලදැයි කියවේ) (සුරවීර, 1997: 169). එම පුවතම රාජාවලියේ දැක්වෙන්නේ මෙසේය.

"…. මා නොමරවයි කියා මා බිසෝ කර ඉදිතොත් පන්සියයක් යෝධයන් දෙමැයි කී විට දිව්රුම් දෙවැයි කී විට ළැමැද තනය ගිව්ස්වා දිව්රුම් දුන්හ. මේ ශ්‍රී ලංකාව ඉසී බිජුව යන්ඩත්, සව්විල්ව යන්ඩත්, බඩු එලදාව ඇට ආදිය බොල්ව යන්ඩත්, මෙබස් තුන කියා දිව්රුම් දී අන් බිසවක නොගනිම්'යි කියා දිව්රුන් දුන් සඳ …."(සුරවීර, 1997: 170).

විජය රජු කුවේණියට දුන් දිව්රුම කඩකළ හෙයින් ඔහුට ඉන් දිව්දෝෂ හටගත් බවත්, පසුව පඬුවස්දෙව් රජුට ද එයම බලපෑ බව රාජාවලිය පවසයි. (එම: 171) කාවන්තිස්ස රජු දුටුගැමුණු හා සද්ධාතිස්ස කුමාරවරුන්ට බත් ගුලි දී දිව්රා පොරොන්දු කරවා ගත් පුවතක් ද මහාවංශයේ එයි. ( සුමංගල හිමි, දේවරක්ෂිත, 1996: 103) එම ප්‍රවෘත්තිය ම සිංහල ථූපවංශයේ මෙසේ සඳහන් කර ඇත. "….නැවත තුන්වන කොටස දෙමළුන් හා සටන් නොකරම්හ'යි කියා දිව්ට කව්යැ'යි කිවූය…." (ගුණවර්ධන, 2005: 152) දිව්රුම යන්න දම්පියා අටුවා ගැටපදයේ සඳහන් වන්නේ, "සපථං කාරයින්සු" යන පදයට කරන ලද අර්ථ විග්‍රහයේදීය. එහි ඊට දී ඇති අර්ථය වන්නේ "දිව් කරවූහු" යන්නයි. (විමලකීර්ති,1967: 260)

ජාතක පොතේ, කට්ඨහාරී ජාතකය, සුතසෝම ජාතකය, අන්ධභූත ජාතකය, සම්බුලා ජාතකය, වැනි කතා පුවත් තුළ ද දිව්රුම හා බැඳි අභිචාර දක්නට ලැබේ. මේ කථා පුවත් තුළ එන සත්‍යක්‍රියාව හා සති පූජාව දිව්රීම හා සම්බන්ධ භාරතීය විශ්වාස දෙකක් බව පැහැදිලි වේ. සංස්කෘත සාහිත්‍යයේ එන ශාකුන්තලයේත්, රාමායණයේත් මෙබඳු අවස්ථා දක්නට ලැබේ. සීතා ලංකාවේ දී දිව්රූ බව සඳහන් වන අතර 'දිව්රුම් වෙල' යන ග්‍රාම නාම ප්‍රවෘත්තියෙන් ඒ බව පැහැදිලි වේ. මේ අනුව දිව්රීම යන්න ලාංකේය ජන විශ්වාස පද්ධතියට ප්‍රවේශ වන්නට ඇත්තේ භාරතීයන්ගෙන් බවට සැක පහළ කළ හැකිය. ඊට හේතුව වන්නේ භාරතීය සම්භවයක් සහිත බොහෝ කථා ප්‍රවෘත්තීන්හි දිව්රීම, සති පූජාව වැනි සංකල්ප දක්නට ලැබීමයි. මේ තත්ත්වය වඩාත් කැපී පෙනෙන්නේ දකුණු ඉන්දියාව හා බැඳි චාරිත්‍ර විමසීමේදීය. විශේෂයෙන් ද්‍රවිඩ සාහිත්‍යයේ පත්තිනි උපත හා සම්බන්ධ කතා පුවත් වලද, මේ ලක්ෂණ වඩාත් කැපී පෙනෙන බව පැහැදිලිය.

දේශීය ශාන්ති කර්මයක් වන කොහොඹා කංකාරියේ උපත් කථාවෙන් ද මහාවංශයේ එන පඬුවස් දෙව්ගේ දිව්දෝෂය සම්බන්ධ පුවත සනාථ වේ. අතීතයේ පැවති දිව්රුම් පිළිවෙතක් මෙහි විජයරාජ කථාවේ එන්නේ මෙසේය.

"නොකරපු හොරකමක් මට කියපු නිසා ඔබවහන්සේත් මාත් දිව්රන්ට ඕනෑය කියා සූර්ය දිව්‍යරාජයා උදාගිරි පර්වතයෙන් උදාවන විට සඳුන් කිරි පැන් කොරහක් තබා අහසට පොළොවට දෙස් කීවාය. ඔබ වහන්සේගේ

මාණික්‍ය රත්නය දැක්කේත් නැත. දුටුවේත් නැතකියා බැමිණි පැන් දැමුවාය. බමුණා ද සෙර තී'මැ'යි කියා පැන් දැමුවාය" (ගොඩකුඹුර, 1963: 42).

බොරු දිවිරුම අතීතයේ පටන් බලවත් අකුසලයක් ලෙස සැලකූ බව සම්භාව්‍ය සාහිත්‍යයෙන් පැහැදිලි වේ. ජාතක පොතේ සඳහන් පදමානවක ජාතකයෙහි එන අශ්ව මුහුණක් සහිත යකින්නිය පෙර ආත්ම භවයකදී තම අනාචාරයේ හැසිරීම වසන් කිරීමට කළ බොරු දිවිරුමක විපාකයක් ලෙස දක්වා තිබේ. (ජාතක පොත 1, 1961: 803)

දිවිරුම සමාජ පාලන උපායක් වශයෙන් සිංහල ජන සමාජය තුළ ක්‍රියාත්මක වූ බව නිසැකය. ජනශ්‍රැතිය තුළ දිවිරීම ක්‍රියාත්මක වන් ආකාරය දෙස බැලීමෙන් එය පැහැදිලි වේ. සිංහල ජන කවි සාහිත්‍යයේද මේ සම්බන්ධ ජන කවි අපට මුණ ගැසේ. පහත දැක්වෙන්නේ තම නිදොස් බව ස්වාමියා ඉදිරියේ ප්‍රකාශ කරන ගැමි කාන්තාවකගේ ප්‍රකාශයකි.

"අහස පොළොව ඉර හඳ දෙවියන් පල්ලා
සූර්ය වංශ දළදා කරඬුව පල්ලා
වැඳූ මව් පියන් හා දරු දෙදෙනා පල්ලා
අන් හිමි සමඟ විසුවේ නැත නුඹ පල්ලා"

සිය ලේලියගේ නොමනා ක්‍රියාවක් දුටු නැන්දනිය එය දිවරා කී බව තවත් ජන කවියක මෙසේ සඳහන් වේ.

"අන්දිරිසා පුතා පල්ල
දොරකඩ කොස් ගහා පල්ල
හෙරළි තැම්බූ හැලිය පල්ල
සිළිං තුනේ පට කුඩේ ඉරා ලිපේ තෙයි"

(විජයශ්‍රීවර්ධන, 1995: 139)

මේ ආකාරයෙන් සාමාන්‍ය ව්‍යවහාරයේ පා, පල්ල, සාක්කි, යන පද තුනෙන් සපථයක් හෙවත් දිවිරුමක් අභිප්‍රේත බව පැහැදිලි වේ. බුදුන් පා, දෙවියන් පා, ඉර හඳ පල්ල, අම්මාපල්ල, නේත්‍රා දෙක පල්ල, අහස පොළොව පල්ල, ඉර හඳ සාක්කි, දෙයියෝ සාක්කි, වශයෙන් මේ යෙදුම් භාවිත වන බව ජනශ්‍රැති අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ජේ. බී. දිසානායකයන්ට අනුව 'පල්' හෝ 'ප' වශයෙන් දිවිරුමේ දී භාවිත කරන්නේ සාවද්‍ය දිවිරුමකදීය. එසේ කරන්නේ තමන් දිවි දෝෂයෙන් ගැළවීමට බව හෙතෙම දක්වයි (දිසානායක,1996:139). සිංහල ජන සමාජයේ විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කරමින් දිවිරීම පැවති බව ජනක්‍රීඩාවක් සඳහා යෙදුණු පහත පද්‍යයෙන් පැහැදිලි වේ. " නෑනෝ නුඹපල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත මේවරයා" තව ද මෙම සංකල්පය ජනවිශ්වාස පද්ධතියේ පමණක් නොව සිංහල සංස්කෘතියට ද බද්ධ වූ සංකල්පයක් බව පැහැදිලිය. බුදුරජාණන් වහන්සේ, දෙවි, දේවතාවුන්, මව, පියා, ඉර, හඳ, මහපොළොව, ආදිය සිංහල සංස්කෘතියේ උතුම් වස්තූන් සේ

සැලකේ. මේ වස්තූන් දෙස් වශයෙන් ගෙන දිවිරීම තුළින් දිවිදොස් හට ගන්නා බව ගැමියෝ විශ්වාස කරති. සාවද්‍ය දිවිරුම් සඳහා මේ සංකල්පය යොදා නොගන්නේ එහෙයිනි.

නූතන මිනිසා කාර්මික අතින් ඉතා දියුණුය. මෙසේ දියුණු අධියක සිටින මිනිසුන් අතර ඇති වන ගැටලු සංසිඳවීම සඳහාත් යුක්තිය පසිඳලීම සඳහාත් අධිකරණය බැඳී සිටී. සැමට සාධාරණය ඉටු කිරීමට නූතන අධිකරණය සැම අතින් ම බැඳී සිටී. මෙහි යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ සාක්ෂි මත පදනම්වය. ලාංකේය ජනතාව අතීතයේ පටන් පැවත එන සාම්ප්‍රදායික ජන විශ්වාස කෙරෙහි තබා ඇති විශ්වාසයේ ද අඩුවක් දක්නට නොලැබේ. ඒ හේතුව නිසා අධිකරණයෙන් ලැබෙන තීන්දු තීරණවලට වඩා නොපෙනෙන දිවිරුමේ බලවේග හරහා ලැබෙන තීන්දු තීරණ කෙරෙහි ඇතැම් මිනිසුන්ගේ විශ්වාසය වැඩි බවක් පෙනෙන්නට තිබේ. ඔවුන් තමන්ට කිසියම් අසාධාරණයක් සිදු වූ විටෙක එය දෙවියන්ට භාර කිරීම තුළින් ඒ බව පැහැදිලි වේ. නීතිය ඉදිරියේ ලැබෙන සාක්ෂි කොතරම් සාධාරණ වුවත් එය පිළිනොගෙන දිවියක් හෙවත් දිවිරුමක් ඉල්ලා සිටීමට මිනිසුන් පෙළඹී ඇත්තේ මේ නිසාවෙනි. මිනිසුන්ගේ මෙබඳු විශ්වාස ඉවත හෙළීමට නූතන රෝම ලන්දේසි නීතියට ද හැකියාවක් ලැබී නොමැත. මෙය නීතියට අමතරව සමාජ පාලන උපායක් ලෙස භාවිත කළ හැකි බවට ඔවුන් ද තේරුම් ගෙන තිබුණාට සැක නැත. 1823 අප්‍රේල් 23 වන දින සම්මත කරන ලද නීති පනත් කෙටුම්පත ඊට කදිම නිදසුනකි (ඇල්ලේපොළ, 2005: 147).

නූතන මිනිසා අතරින් සමහරක් දෙනා දිවිරීම වැනි අදෘශ්‍යමාන බලවේගයක් කෙරෙහි විශ්වාසය තබා ඇත්තේ නූතනයේ ක්‍රියාත්මක නීතිය සම්බන්ධයෙන් ඔවුන් තුළ විශ්වාසයක් නොමැති නිසාවෙන් වන්නට ද පිළිවන. එසේ නැතහොත් දෙවියන් නැතහොත් නීතියේ දිව්‍යමය පක්ෂය ඔවුන්ට නිරන්තරයෙන් දුකේදී පිහිට වන බවට අධි විශ්වාසයක් පැවතීම නිසාවෙන් ද විය හැකිය. සිංහල සංස්කෘතිය තුළ බොහෝ මිනිසුන් දෙවියන් ඉදිරියේ තම දුක ප්‍රකාශ කරනු අපට දක්නට ලැබේ. එම නිසාවෙන් තමාට සිදු වූ අසාධාරණකම් දෙස බලා සාධාරණය ඉටු කර දෙන ලෙස ඉල්ලීම ද ජන විශ්වාස පද්ධතියේ ම කොටසක් බව පැහැදිලි වේ. අධිකරණයේදී සාවද්‍ය සාක්ෂි මත පදනම්ව ඇතැම් තීරණ වෙනස් කිරීමට පිළිවන. එහෙත් දෙවියන් ඉදිරියේ දී මූලික වන්නේ බාහිර ලෝකයේ සාක්ෂි නොවේ. මිනිසුන්ගේ හෘද සාක්ෂියයි.

එසේ නම් යුක්තිය පසිඳලීම සඳහා ලොව පිළිගත් දියුණු ක්‍රමවේදයන් තිබියදී මිනිසා අදෘශ්‍යමාන බලවේග කෙරෙහි විශ්වාසය තබා ඇත්තේ මන්ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ගැටලුව වී ඇත.

ලෝකයේ සෑම රටකම පාහේ නීති සම්මත කරගෙන ඇත්තේ පොදු ජනයා තුළ සාමය හා ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම පිණිසය. ඇතැම් විට මේවා ලේඛනගත නීති විය හැකිය. නැතහොත් සාම්ප්‍රදායික විශ්වාස මත පදනම් වූ ඒවා ද විය හැකිය. අධිකරණය මඟින් දෙනු ලබන යුක්තිය පිළිනොගත් ඇතැම් පුද්ගලයන් තම දුක්ගැනවිල්ලේ විනිශ්චය දෙවියන්ට හෝ වෙනත් අධිමානුෂ බලවේගයකට භාරකරනු ස්වරූපයක් දක්නට ලැබේ. මේ තත්ත්වයට උගත්කමක්, නූගත්කමක් බලනොපායි. ඕනෑම තාරාතිරමක පුද්ගලයෙක් තම දුක්ගැනවිල්ල දෙවියන්ට හෝ වෙනත් බලවේගයකට භාරකරනුයේ නීතියෙන් හෝ අන් කෙනෙකුගෙන් පිහිටක් පිළිසරණක් නොලැබෙන විටකය. ලෞකික විභාග ක්‍රමයකින් විනිශ්චයට එළැඹීමට අකමැති වූ විට නීතියේ දිව්‍යමය පදනම සලකා දෙපාර්ශවයම තෘප්තියට හේතු වන පරිදි දිවිරීම යොදා ගන්නා ලදී.

මේ ආකාරයෙන් සිංහල සංස්කෘතියේ ක්‍රියාත්මක සාම්ප්‍රදායික ජන නීති පද්ධතිය තුළ දිවිරීමට ලැබුණු පිළිගැනීම කොතෙක්ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ විය. මීට අමතරව නූතන නීති පද්ධතිය ක්‍රියාත්මක වන අතර තුර සාම්ප්‍රදායික ජන විශ්වාස පද්ධතියට ලැබෙන තැන කෙබඳු ද යන්න විමසා බැලීම ද මෙහිදී සිදුකර ඇත. නෛතික රාමුවෙන් එපිට ක්‍රියාත්මක මෙම විශ්වාස පද්ධතිය කෙරෙහි මිනිසුන්ගේ විශ්වාසය මෙතරම් දැඩිව පවතින්නේ මන්ද යන්න විමසීමත් මෙය සමාජ පාලන උපායක් වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවත්, සොයා බැලීමටත් මේ යටතේ අවධානය යොමු කර ඇත.

ඉහත අරමුණු සාර්ථක කර ගැනීම පිණිස මෙම පර්යේෂණය වෙනුවෙන් තෝරා ගත් ක්ෂේත්‍රය වන්නේ හොරොව්පොතාන කපුගොල්ලෑව ඓතිහාසික දිවුරුම් දේවාලයයි. ඓතිහාසික වැදගත්කමකින් යුත් මෙම විහාරස්ථානය අපගේ ප්‍රස්තුතයට අදාළ දිවුරුම් ක්‍රමවේදයන් දැනටත් ක්‍රියාත්මක වන ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. අනුරාධපුර හොරොව්පොතාන මාර්ගයෙන් කිලෝමීටර් පනහක් පමණ දුරින් පිහිටි හොරොව්පොතාන නගරයේ සිට වම් පසට ඇති වාහල්කඩ මාර්ගයේ කිලෝමීටර් දොළහක් පමණ ගමන් කළ විට කපුගොල්ලෑව මං සන්ධිය මුණගැසේ. ඉන් දකුණු පසින් විහාරස්ථානයට ප්‍රවේශ මාර්ගය දිස්වේ. බහිරව දෙවියන්ට වැඳුම් පිදුම් කිරීමට යොදා ගත් දේවාලය විහාරස්ථානයේ දකුණු දිගට වන්නට පිහිටා ඇත.

හොරොව්පොතාන, ගලින්බිඳුණුවැව, කහටගස්දිගිලිය ආදී පොලිස්ථානවලින් පමණක් නොව ප්‍රදේශයේ ක්‍රියාත්මක සමිති සමාගම්වලින්, සමථ මූල මණ්ඩලවලින්, විවිධ රාජ්‍ය ආයතනවලින් මෙම ස්ථානයේ දිවුරවීම සඳහා පුද්ගලයන් රැගෙන එන බව දැන ගන්නට ලැබේ. ලංකාව පුරාවට කොතෙකුත් දිවුරුම් ස්ථාන දක්නට ලැබුණත් ඒවායේ වර්තමානය වන විට දිවිරීම ක්‍රියාත්මක වන්නේ අල්ප වශයෙනි. එහෙත් මෙහි අතීතයේ සිට

නොකඩවා දිව්රවීම ක්‍රියාත්මක වන හා එහි සත්‍යය මිනිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය වී ඇති ස්ථානයක් බව, අසන්නට ලැබුණු නිසා මේ ප්‍රස්තුතයේ ක්ෂේත්‍රය ලෙස කපුගොල්ලෑව තෝරා ගෙන ඇත. මෙම දේවාලයේ විශේෂත්වය වන්නේ දෙවියන්ට ආවතේව කිරීම සඳහා පිරිමින් වෙනුවට කාන්තාවන් යොදවා තිබීමයි. ඔවුන් 'කපු අම්මාවරුන්' වශයෙන් හඳුන්වනු ලැබේ. එබඳු කපු අම්මලා තිදෙනෙක් බහිරව දෙවියන්ගේ ආවතේවය පිණිස මෙම දේවාලයේ කටයුතු කරයි. දිව්රීම හා සම්බන්ධ සාම්ප්‍රදායික අභිචාර විධීන් තවමත් මෙහි දක්නට ලැබීම විශේෂත්වයකි.

## ***ක්‍රමවේදය (Methodology)***

මෙම පර්යේෂණයේදී දත්ත රැස් කිරීම ආකාර දෙකකින් සිදුකළ අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත විය. එහිදී සහභාගීත්ව නිරීක්ෂණය යටතේ තොරතුරු ඒකරාශී කර ගෙන ඇත. මීට අමතරව සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිත කළ අතර එහිදී විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ හා දේවාලයේ ආවතේවයට සිටි පිරිස යොදා ගැනුණි. ද්වීතියික දත්ත විශ්ලේෂණයේදී පුස්තකාල පරිශීලනය කරන ලදී. මේ යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලීය පුස්තකාලය හා රජරට විශ්වවිද්‍යාලීය පුස්තකාලය යොදා ගත් අතර මෙහිදී දිව්රීම සම්බන්ධයෙන් ලියවුණු පොත පත පරිශීලනයට ප්‍රමුඛස්ථානය දෙන ලදී. මේ සම්බන්ධයෙන් වැදගත් මූලාශ්‍රයක් ලෙස පොලිසි මගින් දිව්රීම සඳහා යොමු කිරීමේ දී නිකුත් කරන ලිපි ලේඛන ද සොයා ගන්නට හැකි විය. විධිමත් හා අවිධිමත් ලෙස තොරතුරු නෛතිකමය රාමුව තුළ දිව්රීම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සොයා බැලීම සඳහා නියැදියක් වශයෙන් හොරොව්පොතාන, ගලෙන්බිඳුණුවැව යන පොලිස් ස්ථානවල පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරුන් මුණගැසී විධිමත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත ඒකරාශී කරගෙන ඇත. තවද නියැදියක් ලෙස ප්‍රදේශයට ආසන්න ග්‍රාමනිලධාරී වරයෙක් ද සම්මුඛ සාකච්ඡා සඳහා යොදා ගෙන ඇත. හොරොව්පොතාන, ගලෙන්බිඳුණුවැව ආදී පොලිස් ස්ථානවලින් පමණක් නොව ප්‍රදේශයේ ක්‍රියාත්මක සමිති සමාගම්වලින්, සමථ මූලමණ්ඩලවලින් පමණක් නොව විවිධ රාජ්‍ය ආයතනවලින් ද කරුණු ගොනු කර ගන්නා ලදී. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වන බැවින් දත්ත විශ්ලේෂණය පර්යේෂකයා වන මා විසින් සිදු කොට ඇත.

දිවිය හෙවත් දිව්රීම ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන්නකි. අප්‍රිකානු සමාජවල ද බටහිර හා ආසියාතික රටවල ද මේ තත්ත්වය දක්නට ලැබේ. ඇමෙරිකාවේ පුරවැසි භාවය ලැබීමේ දී අදටත් දිව්රුම් දීමක් සිදුකරන බවක් සඳහන් වේ. ඉන්දියාවේ ද්‍රවිඩ සංස්කෘතීන් තුළද ලංකාවේ සිංහල ද්‍රවිඩ මුස්ලිම් ආදී ජන සමාජවලද දිව්රීම තදින් ක්‍රියාත්මක වන බවක් දක්නට ලැබේ. එමෙන් ම ආගමික වශයෙන් ද දිව්රුම ක්‍රියාත්මක වන ආකාරය ඉස්ලාම් ආගම තුළ මුස්ලිම්වරුන් ද, ක්‍රිස්තියානි ආගම තුළ කිතුනුවන් ද, හින්දු ආගම

තුළ ද්‍රවිඩයන් ද දිවිරීම හා බැඳි චාරිත්‍ර සිදු කිරීමෙන් මේ බව පැහැදිලි වේ. මෙතුළින් දිවිරුම ආගමික සංකල්පයක් දක්වා වර්ධනය වී ඇති ආකාරය ද පෙනෙන්නට තිබේ. දිවිරුම ලංකාවේ ක්‍රියාත්මක වන්නේ දෙවියන් පිළිබඳ හෝ අධිමානුෂීය බලවේග කෙරෙහි පවත්නා අසීමිත විශ්වාසය පදනම් කර ගෙනය. දිවිරුම වූ කලී අතිශය ප්‍රබල වූ පොරොන්දුවකි. මේ තුළින් කෙනෙක් එක්තරා රාමුවක් තුළ කොටු කර තැබීමක් ද සිදුවෙයි.

රාජකාරීමය වශයෙන් පුද්ගලයෙක් වැඩභාර ගැනීමේදී ලිඛිත පොරොන්දුවක් දී අදාළ රාජකාරියේ වැඩභාර ගනී. මෙය ද එක්තරා ආකාරයක දිවිරුමකි. තව ද මහජන නියෝජිතයන් වශයෙන් පත්වන ජනාධිපති, අගමැති, හා මැති ඇමතිවරුද, කිසියම් දිවියකට යටත්වන බව පෙනේ. සාක්ෂ්‍යකරුවෙකු උසාවියේ දී සාවද්‍ය ප්‍රකාශ නොදෙන බවට දිවිරා පොරොන්දු වී සාක්ෂ්‍ය දීම ආරම්භ කරයි. සාමදාන විනිශ්චයකරුවෙකු නිකුත් කරන දිවිරුම් ප්‍රකාශය ලංකාවේ ඕනෑම තැනකට වලංගු ලියවිල්ලක් වෙයි. නූතන විවාහ චාරිත්‍රවල මනාලයා මනාලිය ඉදිරියේත්, මනාලිය මනාලයා ඉදිරියේත් දිවිරා ප්‍රකාශයක් කරනු ලබයි. නම් වෙනස් කිරීම, වාසගම් වෙනස් කිරීම, ආදී අවස්ථා වලදී ද මේ තත්ත්වය දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ මේ සියල්ල අපගේ ප්‍රස්තුතයේ ක්‍රම විකාශනයේ ප්‍රතිඵල ලෙස ක්‍රියාත්මක වන බවයි. සිංහල ගැමි ආගම තුළ දක්නට ලැබෙන යාතු කර්ම, පුද සිරිත්, ආශ්‍රිතව ද දිවිරීම ක්‍රියාත්මක වන ආකාරය යකුන් එළවීමේ දී ඔවුන් දිවිරා නැවත නොඑන ලෙස පොරොන්දු කරවා ගැනීම තුළින් පැහැදිලි වේ.

'රොබට් නොක්ස්'' ද දිවිරීම හා සම්බන්ධ අත්දැකීම් සිය වාර්තාවේ සඳහන් කොට ඇත. එක්තරා නඩුවකදී ගම්ප්‍රධානියෙකුට එරෙහිව බොරු දිවිරුමක් දී පසුව ගම්ප්‍රධානියාගේ ගෙට ගිනි තබා ඔහු වරදකරු බවට පත් කළ පුද්ගලයෙකු පිළිබඳ පුවතක් හෙතෙම සඳහන් කර ඇත. රොබට් නොක්ස්ගේ මෙම අත්දැකීමට අනුව පැහැදිලි වන්නේ ඒ ඒ පුද්ගලයා තුළ පවතින විශ්වාසයේ ප්‍රමාණය මත මේවා ක්‍රියාත්මක වන බවයි. එහෙත් ඇතැම් පුද්ගලයන් තම නිර්දෝෂීභාවය ඔප්පු කරලීම සඳහා අවදානම් සහගත දේ ද සිදුකරන බව ද තවදුරටත් හෙතෙම විස්තර කරයි.

"වාද විවාදයට හා මතභේදයට හේතු වන ගැටලු නිරවුල් කරගැනීම සඳහා ඇතැම් විට දේවාල තුළදීම දෙවියන් ඉදිරියෙහි අදාළ දෙපාර්ශවයම දිවිරීමේ සිරිතක් ද මෙහි පවත්නේය. වඩාත් බරපතල සිද්ධි පිළිබඳ ඇත්ත නැත්ත සනාථ කරගනු පිණිස උතුරන තෙලෙහි අත දැමීම වැනි අවදානම් සහගත දේ ද සිදුකරයි" (අල්විස්,2004:129).

පැරණි ලංකාවේ පැවති දිවිරුම් ක්‍රම අටක් පිළිබඳව 'ජෝන් ඩොයිලි' සිය 'සිංහලයේ ආණ්ඩු ක්‍රමය' නැමැති කෘතියේ සඳහන් කර ඇත. ඔහුට අනුව දිවිරීමේ පරමාර්ථය වූ කලී මානුෂික අවබෝධයට අවිෂය වූ කරුණු පිළිබඳව දේව විනිශ්චය ලබා ගැනීමයි. ගරු ගාම්භීර ආකාරයෙන් චාරිත්‍ර විධි ද සහිතව

ශාප කළ විට පැහැදිලි ලකුණක් දක්නට ලැබේයැ'යි නැතහොත් ආපදාවක් මඟින් විනිශ්චය ලැබේයැ'යි ලාංකිකයන් විශ්වාස කරන ලදැ'යි හෙතෙම තවදුරටත් පවසයි (ඇල්ලේපොල, 2005: 140).

1. උණුතෙල් මඟින්
2. වී මඟින්
3. මැටි බඳුන් මඟින්
4. පුළුක් ගොබ එල්ලීම මඟින්
5. පොළවට ගැසීමෙන්, මඩ හා වතුර ඉසීමෙන්
6. වී සාක්ෂ්‍ය කොට
7. කිතුල් ගස් මඟින්
8. දේවාලේ දිවිරීම

ආදිය මෙකළ පැවති දිවිරුම් ක්‍රමවෙයි. මීට අමතරව ගිනියම් යකඩ මඟින් හා නයා මඟින් ද දිවිරා ඇති බව සඳහන් වේ. තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් දෙපක්ෂයට ම නියම සාක්ෂිකරුවන් ඉදිරිපත් කිරීමට නොහැකි වූ හෙයින් රටේ සිරිත පරිදි දඹුලු දේවාලය ඉදිරිපිට දී තෙල් මඟින් දිවිරන ලෙසට 1817 ජනවාරි මස 24 වන දින නිකුත් කරන ලද ආඥාවක් පිළිබඳ 'පමුණුවේ ලේකම් - හරස්ගමරාල නඩුව' සම්බන්ධ වාර්තාවෙන් පැහැදිලි වේ (ඇල්ලේපොල, 2005, 146).

ඉහත දිවිරුම් ක්‍රම ක්‍රියාත්මක වීම දෙස බැලීමේ දී වැඩි වශයෙන් සොරකම හා ඉඩම් ආරවුල් සම්බන්ධ නඩුවලදී මේ චාරිත්‍රය සිදුකර ඇති බව දක්නට ලැබේ. මෙසේ පුද්ගලයන් ලවා දිවිරවීමට බලය ඇත්තේ ඒ ඒ දිසාභාර දිසාපතිවරුන්ට හා ඔවුන්ගේ නියෝගය පරිදි වෙනත් කෙනෙකුට පමණි (එම: 140).

### *දිවිරීම හා බැඳි අභිචාර විධි*

දිවිරීම හෙවත් සපථය ආකාර දෙකකින් හඳුනාගත හැකිය. එනම් සපථය හා වද විභාගයයි. මෙහි එන තෙල් මගින් දිවිරීම, නයා මගින් දිවිරීම ආදිය වද විභාගය යටතට වැටේ. එහිදී සිදුවන්නේ බරපතල ක්‍රියාවකට මුහුණ දී තම නිදොස් බව ප්‍රකාශ කිරීමයි (රත්නපාල, 2004: 10).

දිවිරුමේදී ඊට ආවේණික අභිචාර විධි ගණනාවක් දක්නට ලැබේ. තෙල් මඟින් දිවිරීමට නම් දින තුනකට පෙර සිට සියලු කිලිවලින් වැළකී සිටිය යුතුය. එමෙන් ම දිවිරුම් පොළට පැමිණෙන විට විත්ති පැමිණිලි දෙපාර්ශවයම පොල් ගෙඩි තුන බැගින් හෝ හතර බැගින් ගෙන යා යුතුය. පසුව ඔවුන් විසින් ම ඒවා සිඳ තෙල් හැලියක් උණුකර ගනී. තෙල් රත් වූ බව පරීක්ෂා කර බලා එකිනෙකා තෙලෙහි ඇඟිල්ලක් ඔබා ඒ බව කඩදාසියකට තෙල් බිංදු දෙක, තුනක් දමා පෙන්විය යුතුය. එසේම එයට යාබදව උණුකර

ඇති ගොම දිය භාජනයට තුළට ද අත දැමිය යුතුය. මෙහි විනිශ්චය ලැබෙන්නේ වරදකරුගේ ඇඟිල්ල පිච්චී තිබීමෙන් හා නිවැරදිකරුගේ ඇඟිල්ල නොපිච්චී තිබීම තුළිනි. වී මඟින් දිවුරීමේ දී ගැටළුවට අදාළ කෙතේ අස්වැන්නෙන් ගත් වී ස්වල්පයක් කොටා සහල් කර එයින් බත් උයා දෙපාර්ශවයම අනුභව කළ යුතුය. එසේ අනුභව කර අදාළ කෙතේ අයිතිය තමාට ඇති බව පවසා දිවුරීම කරනු ලබයි. මැටි බඳුන් මඟින් දිවුරීමේ දී ආරවුල් සහිත භූමි සීමාවේ තබන ලද පොල් ගෙඩියක් සහිත මැටි මුට්ටිය බිඳ එහි පොලය ද බිම ගසා එය දෙපාර්ශවය විසින්ම අනුභව කරනු ලබයි. අනතුරුව අදාළ ඉඩම තමාට අයිති බවට දිවුරා කියා එසේ තමා බොරු කියන්නේ නම් දෙවියෝ සාක්කි බව සඳහන් කරයි.

මේ ආකාරයෙන් දිවුරීමට අදාළ චාරිත්‍ර නූතනයේ දක්නට නොමැති තරම්ය. ඇතැම් දිවුරුම්වල ප්‍රතිඵල ලැබෙන්නේ දින හත, දහහතර, විසිඑක, ගත වූවාට පසුවය. මේ කාලය තුළ කිසියම් පාර්ෂවයකට ඇතිවන අලාභ, අසනීප, කරදර, හදිසි මරණ, ධනහානි, වස්තු හානි, ආදිය මත වරදකරු තීරණය කරනු ලැබේ.

කපුගොල්ලෑව දිවුරුම් දේවාලයේ දිවුරීම සම්බන්ධයෙන් පවතින අභිචාර විධි මීට වඩා වෙනස් ස්වරූපයක් උසුලයි. මෙහිදී දිවි කඳ භාරගැනීම හා දිවි පණම් තැබීම විශේෂයි. දිවිකඳ භාරගත යුත්තේ පැමිණිලි පාර්ශවය විසිනි. ඒ සඳහා හාල් සේරු පහක්, පොල් ගෙඩි පහක්, ඉදුණු කෙසෙල් කැනක්, අළු කෙසෙල් කැනක්, සුදු රෙදි යාර දෙක හමාරක්, ඉටිපන්දම් දෙකක් හා හඳුන්කූරු පැකට් එකක් අයත් වෙයි. වර්තමානයේ මේ තත්ත්වය වෙනස් වී ඇති අතර මේ සියලු අමුද්‍රව්‍ය සඳහා රුපියල් හයසියයක මුදලක් දේවාලයට කැපකිරීම ප්‍රමාණවත් වෙයි. හැකි නම් දිවිකඳ භාරගත් පිරිස හේවිසි හොරණෑ ආදිය ද ඊට එක් කර ගත්තාට වරදක් නැත. දිවි පණම් තැබීමට විත්ති පාර්ශවයට අවශ්‍ය වන්නේ බුලත් හතළිහක් හා කාසියක් පමණි. දිවුරීමට පෙරදින සවස චෛත්‍ය රාජයා අසල දිවි පණම් තැබිය යුතුය. ඊට පෙර කඩවර දෙවියන් උදෙසා කඩවර තොරණ අසල ද බුලත් යහනක් තැබිය යුතුය. ඇතැම් විට දිවුරීමට අවශ්‍ය කළමනා සකස් කිරීමේදී ම එම ස්ථානයේ වරදකරු සිටියේ නම් එයින් බිය වී සිය වරද පිළිගන්නා බව කපුගොල්ලෑව දිවුරුම් දේවාලයේ කපු අම්මා කෙනෙකුගෙන් අසා දැන ගන්නට ලැබුණි. අදාළ දිවිය සම්බන්ධයෙන් ප්‍රකාශ කළ යුතු වාක්‍ය 'දිවි සීට්ටුව' වශයෙන් හඳුන්වා ඇත. කපුගොල්ලෑව දේවාලයේදී මෙය හඳුන්වන්නේ 'දිවි වාක්‍යය' වශයෙනි.

පසුදින උදෑසන කහකඩ පායන්නට මතතෙන් දිවුරීම කළ යුතුය. ඒ සඳහා දිවි වාක්‍යයක් සකස් කරනු ලැබේ. (ඇමුණුම 2) අනතුරුව ස්වාමීන් වහන්සේ ජයමංගල සජ්ඣායනා කරන අතර තුර දිවි වාක්‍යය කියා දිවුරීම සිදු කළ යුතුය. දිවුරීමට පෙර දෙපාර්ශවයම මෙහි අනුහස් පැහැදිලි කර දෙනු ලැබේ.

දිව්රීමෙන් පසු ස්වාමීන් වහන්සේගේ අත්සනින් යුතු ලියවිල්ලක් ඔවුන් යොමු කළ ආයතනය වෙත යොමු කරනු ලැබේ. (ඇමුණුම 3)

ඉහත අභිචාර දෙස බැලීමේ දී දක්නට ලැබෙන්නේ මෙය හුදෙක් විශ්වාසය මත පමණක් පදනම් වූ චාරිත්‍රයක් බවයි. කෙසේ වෙතත් පිළිගත් නීති සම්ප්‍රදායක් තිබියදී ඊට පිටින් ගොස් මෙසේ දිව්රීම තුළින් තමන්ට විසඳාගත නොහැකි ගැටලුවක් දෙවියන්ට භාර කිරීමක් සිදු කොට ඇත. දිව්රීමේ දී වයස් භේදයක් හෝ දැන උගත් භේදයක් බලනොපායි. මෙහිදී මිනිසා සොයා යන්නේ සියලු මිනිසුන්ට සාධාරණය ඉටු කර ගැනීමට සිටින එකම ලෝක පාලන දෙවියන් ලඟටය. නූතන නීති පද්ධතිය කෙරෙහි පුද්ගලයාගේ සැකයක් හෝ අප්‍රසාදයක් නොතිබුණ ද සාම්ප්‍රදායික වශයෙන් ක්‍රියාත්මක වූ ඇදහිලි විශ්වාස පද්ධතිය බැහැර කිරීමට දක්වන අකමැත්ත හේතුවෙන් දිව්රුම නැමැති සමාජ පාලන උපාය මාර්ගයට නෛතිකමය වටිනාකමක් හිමි වී ඇත.

### *බොරු දිව්රුම හා එහි ප්‍රතිවිපාක*

දිව්රීම සඳහා යොමුවන සියලු පිරිස් සත්‍ය ලෙසම දිව්රන්නේද යන්න විමසා බැලිය යුත්තකි. කිසියම් දඬුවම් ලැබීමට නියමිත වරදකට හසු වූවෙක් බොරු දිව්රුමකට පෙළඹිය නොහැකිද? එසේම බොරු දිව්රුමෙන් ඔහුට ප්‍රතිවිපාක ලැබෙන්නේද යන්න පිලිබඳව ද විමසා බැලීම වටී. පුරාණ ලංකාවේ දිව්රුම් ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී බොරු දිව්රුම වැලැක්වීම සඳහා නීති සම්මත කළ බවක් දක්නට ලැබේ. කපටි මිනිසුන් බොරු සාක්ෂි සැපයීම නිසා එය වැළැක්වීම පිණිස ඉංග්‍රීසි ආණ්ඩුව විසින් නීති සම්මත කළ බව ඩොයිලි වාර්තා කරයි. ඊට අනුව 1823 අප්‍රේල් 23 වන දින සම්මත කරගත් තීන්දුවක් මෙසේ දැක්විය හැකිය.

"1883 අප්‍රේල් මස 02 වන දින මඟුල් මඩුවේදීය. මින් මතු මේ උසාවියේ සාක්ෂ්‍යකාරයන් ලෙස පෙනී සිටින බෞද්ධ භක්තිකයෝ පහත සඳහන් ලෙස දිව්රුම් දිය යුත්තාහ. ගිහියෙකු නම් තම සාක්ෂ්‍යයේ සත්‍යතාව ගැන දිව්රුම් දිය යුතු විට ලියනආරච්චි නොහොත් පියුම්ආරච්චි, හිරගේ කංකානම, කටුකුල්ලේ කෝරලේ, ආරච්චිල යන මොවුන් විසින් හේ මහදේවාලයේ දැඩිමුණ්ඩ දේවතා බණ්ඩාර කෝවිලට හා පත්තිනි දේවාලයට කැඳවා ගෙන යනු ලැබේ. දේවාලවල දොරවල් විවෘත කළ විට කපුරාල යාතිකා කරයි. ඉන් පසු සාක්ෂ්‍යකාරයා පූජාසනයට ළං වී දේව රූපය දෙසට අත් ඔසවා මෙසේ කිය යුතුය. "මම අසවලා කෙරෙහි වෛරයෙන් විරුද්ධව හෝ අසවලා කෙරෙහි ප්‍රේමයෙන් පක්ෂව හෝ බොරු සාක්ෂ්‍ය දිනිම් නම් මේ එසවූ අත් කොර විය යුතුය. මම අසවලා සම්බන්ධයෙන් ඇසූ දෙය හා ඇත්ත වශයෙන් දුටු දෙය ප්‍රකාශ කෙළෙමි. මම බොරුවක් හෝ අසත්‍යයක් හෝ පැවසූයෙම් නම් තුන් දවසක් හෝ තුන් වරුවක් හෝ හත් දවසක් හෝ හත්

වරුවක් හෝ ඇතුළත දෙවියෝ මට දඬුවම් කෙරෙත්වා" (ඇල්ලේපොල, 2005: 147).

රොබට් නොක්ස් ඉහත සඳහන් කර ඇති ආකාරයට බොරු දිවිරුමක් දුන් කෙනෙක් ගම් ප්‍රධානියෙකුගේ ගෙට ගිණි තබා ඔහු වරදකරු බවට පත්කොට ඇත. මෙහිදී බොරු දිවිරුම්කරුට ලැබුණු දඬුවම කුමක්ද? ඇතැම් විට මිනිසුන් තම බලවත්කම ලෝකයා ඉදිරියේ කියා පෑමට උත්සහ කරන අවස්ථා ද ඇත. වරක් ක්ෂේත්‍ර අධ්‍යයනයකදී මුණ ගැසුණු පුද්ගලයෙකුගෙන් ලද තොරතුරක් මත බොරු දිවිරුම්කරු සොයා යන්නට මා හට හැකිවිය. එහෙත් ඔහුගේ ප්‍රකාශය වූයේ තමා විසින් එසේ කියා ඇත්තේ තම මිත්‍රයන් පුදුම කරවීමට බවයි. තවදුරටත් ඔහු මෙසේ ද සඳහන් කළේය

"මම කපුගොල්ලෑවේ දේවාලෙට දිවිරන්න ගියේ මගේ උවමනාවට නෙමෙයි. මම අපේ ගමේ කෙනෙක්ගෙන් සල්ලි වගයක් අරන් තිබුනා. මම එයාට ඒක ටික ටික දුන්නා මට පුළුවන් වේලාවට. පස්සේ ඒ මනුස්සයා කිව්ව මම සල්ලි දුන්නෙ නැහැ කියල. එයා පොලිසියේ පැමිණිල්ලක් දැම්ම මම ගියාට පස්සෙ මං කීව මං සල්ලි දුන්නා කියල. එයා කීවා එහෙනං කපුගොල්ලෑව දිවිරන්න කියල මං දිවුරුවා. මගෙ යාළුවෝ හිතුවෙ මං බොරුවට දිවිරුවා කියලා. ඒත් මං එහෙම කළේ නැහැ. ඉතිං මං ඒ ගොල්ලන්ට කිව්ව මං දේවාලෙට සිමෙන්ති කොට්ට පහක් දෙනව කියලා පොරොන්දුවෙලා මට දඬුවම් දෙන්න එපා කියලා දිවිරුවා කියලා." (කුමාරසිංහ,වයස 35)

බොරු දිවිරුමකට ලැබුණු දඬුවමක් සම්බන්ධයෙන් හොරොව්පොතාන නගරයේ ත්‍රීවීලර් රථයක් පදවන සෙනෙවිරත්න මහතාගෙන් (චූටි අයියා) මෙසේ දැනගන්නට ලැබුණි.

"අපේ ගමේ ඉන්නවා ජයතිස්ස කියලා මිනිහෙක් මිනිහ ටිකක් හොරකං කරනවා. සැරයක් අපේ පැත්තේ ගෙදරකින් බඩු වගයක් හොරකම් කලා කියලා ඒ මිනිස්සු ජයතිස්සව සැක කළා. පස්සේ කපුගොල්ලෑවේ දිවිරන්ඩ ගිහින් තිබුනා. ඒ ඇවිත් දවස් තුනක් යන්ඩ හම්බුනේ නෑ අකුණක් ගහලා මිනිහගෙ ගෙදර තිබ්බ්ච පොල්ගස් පහක් කඩාගෙන වැටුනා. ඒකෙන් මිනිහා හොරා කියලා ඔප්පු වුනා." (සෙනවිරත්න, වයස 48)

මෙය සත්‍යවශයෙන්ම දිවිරීමේ ප්‍රතිඵලයක් මත සිදුවීද නැතහොත් ස්වභාවිකව සිදුවූ දෙයක්ද යන්න නිගමනය කළ නොහැක. තවද බොරු දිවිරුමෙන් ගෙවල් කැඩුණු අවස්ථා, වගාපාළු අවස්ථා කොතෙකුත් අසන්නට ලැබේ. මේ කරුණු දෙස බැලීමෙන් පෙනීයන්නේ බොරු දිවිරුම තුළින් ලැබෙන දඬුවම් නිශ්චිත වශයෙන් ඒ සඳහාම ලැබෙන්නේද යන්න ස්ථිර වශයෙන් කිව නොහැකි වන බවයි. එම නිසා මෙය හුදෙක් මිනිසුන්ගේ විශ්වාසය මත පමණක් පදනම්ව ඇත සංකල්පයක් සේ පෙනී යයි.

එහිදී ඔහු ද සඳහන් කළේ එසේ කිරීමට තබා, සිතීමටවත් ඉඩක් එම ස්ථානයේදී නොලැබෙන බවයි. එහෙත් බොරු දිවිරුම් දෙන පුද්ගලයන් නැත්තේ ම නොවෙයි. බොරු දිවිරුමකින් හෝ සමාජ අපවාදයකින් ගැලවීමට ඇත්නම් ඊට ඔවුන් පෙළඹෙන බව නිසැකය. හොරොව්පොතාන පොලීසියේ පැමිණිලි අංශයේ සාජන් සුදේශ් මහතා සිය අත්දැකීමක් මෙසේ විස්තර කළේය.

"පහුගිය දවසක කාන්තාවන් දෙන්නෙක් පැමිණිල්ලක් දාන්න ආවා. මේ අයගේ ගැටලුව වුණේ පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා විත්තිකාරිය සමඟ අනියම් සම්බන්ධයක් පැවැත්වීමයි. මම දෙපාර්ශවයටම අවවාද කරලා ගැටළුව සමතයකට පත් කරන්න උත්සහ කළා. ඒත් විත්තිකාරිය තමා එවැනි සම්බන්ධයක් නොපවත්වන බවට එකහෙළා ම කියා සිටියා. මම මෙය විසඳීමට කොතෙක් උත්සාහ ගත්තත් පැමිණිලිකාරිය දැඩි ලෙස කියා සිටියේ තමාට දිවියක් ඕනෑ කියලා. ඒ නිසා මම ඔවුන්ට ලිපියක් සකස් කරලා දුන්නා. කපුගොල්ලෑව දේවාලයේ දිවිරන්නට. මේක නීතියට පටහැනි නිසා අපි මේවා පොත්පත් වල ලියන්නේ නැහැ. කොහොම හරි දවස් කිහිපයකින් පැමිණිලිකාරිය මට මුණ ගැහුණා. එහිදී ඇය සඳහන් කළා මේ වන විට විත්තිකාරිය දැඩි ලෙස අසනීප වී සිටින වග. තවත් ටික දිනක් ගත වෙන කොට මට අර විත්තිකාරියත් මුණ ගැසුණා. මට පුදුම හිතුණා. ඒ කාන්තාවගේ ස්වරූපය ඉස්සරට වඩා වෙනස් වෙලා තිබුණා. අතපය දරදඬු වෙන හා ඇතැම් විට මුළු සිරුර ම පණ නැතිව යන ආකාරයේ අසනීපයක් ඇයට ඇති බව දැන ගන්නට ලැබුණා."

ඉහත පොලිස් නිලධාරියාගේ ප්‍රකාශය තුළින් පැහැදිලි වන්නේ ඇතැම් විට විත්තිකාර කාන්තාව සමාජ අපවාදයෙන් ගැලවීම සඳහා බොරු දිවිරුමක් කරන්නට ඇති බවයි. ඇයට දෙවියන්ගෙන් ලැබුණු දඬුවම කෙසේ වෙතත් තමා බොරු දිවිරුමක් කර ඇති බවට නිතර නිතර කල්පනා වීම තුළින් මානසික වශයෙන් බිඳ වැටීමක් සිදුවන්නට ඇති බව කල්පනා කළ හැකිය.

### *දිවිරීම නූතන නෛතික රාමුව තුළ ක්‍රියාත්මක වන ආකාරය*

දිවිරීම පුරාණ ලංකාවේ නෛතික පදනමක් මත ක්‍රියාත්මක වුවද නූතන නීති පද්ධතිය තුළ මේ සංකල්පය ක්‍රියාත්මක වන බවක් දක්නට නොලැබේ. එහෙත් නෛතික රාමුවෙන් පිට ක්‍රියාත්මක මේ සංකල්පය කෙරෙහි මිනිසුන් දැඩි සේ විශ්වාසය තබා ඇත්තේ නීතියේ බලය ඉක්මවා ගිය බලයක් දෙවියන් තුළ පවතින බව සලකා ගෙනය. එමෙන් ම බොහෝ මිනිසුන් කල්පනා කරන කරුණක් නම් ලෝකයේ පියවි ඇසට නොපෙනෙන සදාතනික සත්‍යයක් පවතින බවයි. එය කිසිවෙකුටත් වෙනස් කළ නොහැකි බවද ඔවුහු දනිති. අසාධාරණයක් වූ විටෙක "සත්‍ය ජයගනීවා" "දෙයියෝ බලාගනී" ආදී ප්‍රකාශ කරන්නේ එහෙයිනි.

සාමාන්‍ය නීතිය තුළ විභාග වන නඩු වර්ග දෙකකි. සිවිල් නඩු හා අපරාධ නඩු ඒ අතර වේ. කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් නඩු පැවරීමට ස්ථිර වශයෙන්ම රජය බැඳී සිටී. එහෙත් සිවිල් නඩු විභාග වන්නේ පුද්ගලයන්ගේ ඕනෑ එපාකම් මතය. සිවිල් නඩු අතර එන සාමාන්‍ය සොරකම් ඉඩම් ආරවුල්, අපහාස කිරීම්, බැණවැදීම්, පෙම්හබ ආදිය පොලීසිය තුළම විසඳාලීමට උත්සාහ කරන අතර දෙපාර්ශ්වයේ කැමැත්ත පරිදි අවශ්‍ය නඩුමගට බැසිය හැකිය. උසාවියේ නඩුව විභාග වන අතර එසේ සාමාන්‍ය නඩුවක් නම් සමථ මූල මණ්ඩලය වෙත දෙපාර්ශවය යොමු කරවනු ලබයි. සමථ මූල මණ්ඩලවලදී හැකිතාක් උත්සාහ කරනු ලබන්නේ දෙපර්ශ්වය සමථයකට පත් කිරීමටය. එසේ කිරීමේදී මෙහි සඳහන්වන දිවිරීම වැනි අධිමානුෂික බලවේග කෙරෙහි පුද්ගලයන් දරන ආකල්ප අනුව එබඳු ක්‍රියාවන් සඳහා දේවාලවලට හෝ අන් ස්ථානවලට යොමුකරනු ලබයි. ඒ හැරුනු කොට නූතන නෛතික රාමුව තුළ දිවිරීම වැනි අධිමානසික විශ්වාස සඳහා නෛතික පදනමක් දක්නට නොලැබේ.

එහෙත් එබඳු ක්‍රියා පිළිබඳ ඇතැම් පොලිස් නිලධාරි මහතුන් හා ඇතැම් රජයේ නිලධාරින් තුළ ද මේ සම්බන්ධයෙන් දැඩි විශ්වාසයක් පවතී. කෙසේ වෙතත් ලාංකීය ජනතාව තුළ මේ සම්බන්ධයෙන් ඇති විශ්වාසය ඉතා පහසුවෙන් ඉවත් කළ නොහැකිය. එය ඉතිහාසයේ සිට මේ දක්වා පැවත එන්නකි. ලාංකිකයන් අතර බොහෝදෙනෙක් අදහන ජන ආගම තුළ මේ කරුණු බද්ධ වී පවතී. එසේ හෙයින් නූතන දියුණු සමාජ ක්‍රමය සඳහා උගත් නූගත් බේදයකින් තොරව මෙබඳු සංකල්ප ක්‍රියාත්මක වන බව දක්නට හැකිය.

හොරොව්පොතාන ප්‍රදේශයේ ජනතාව මේ සම්බන්ධයෙන් දැඩි විශ්වාසයකින් කටයුතු කරන බව පැහැදිලි වන්නේ සොරකමක් හෝ ඉඩම් හබයක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කරන අවස්ථාවක දී දිවියක් අවශ්‍ය බව තරයේ ප්‍රකාශ කර සිටීමෙනි. එසේ ඉල්ලන්නේ පොලිසිය තුළින් යුක්තිය පසිඳලීම සාධාරණ නොවෙති'යි යන හැඟීම නිසා යැයි කිව නොහැකිය. කෙසේ වෙතත් හිතවත්කම්, දැන හැඳිනීම්, පොලීසිය තුළ තිබුණ ද දෙවියන් ඉදිරියේ හිතවත්කමක් හෝ දැන හැඳිනීමත් කිසිවෙකුටත් තබාගත නොහැකි බව දන්නා නිසාවෙන්ද විය හැකිය. මිනිසුන්ගේ දැඩි ඉල්ලීමට කන් දෙන පොලීසිය ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය ලිඛිත අවසරයක් ලබා දෙන්නේ එහෙයිණි.

***දිවිරීම සමාජයට බලපාන්නේ කෙසේද?***

දේවාලය තුළ විවිධ හේතූන් මත දිවිරීම සඳහා පැමිණෙන පිරිස් දැක ගන්නට ලැබේ. ඒ අතර ඉඩම් ආරවුල්, සොරකම්, අනියම් ප්‍රේම සම්බන්ධතා, අපහාස කිරීම්, කේලාම් කීම් ආදිය ඒ අතර ප්‍රධාන වේ. මෙසේ පැමිණෙන

පුද්ගලයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරනු ලැබීය. එහිදී දැකගන්නට ලැබුණේ විශේෂත්වයකින් තොරව උගත්, නූගත්, දුප්පත්, පොහොසත් සියලු පාර්ශ්වයන් මේ සඳහා යොමු වන බව දැක ගන්නට ලැබේ.

විහාරස්ථානයේ ගරු ස්වාමීන්වහන්සේ සඳහන් කළ පරිදි වරක් ආරක්ෂක අංශයේ ඉහළ නිලධාරියෙකුට විරුද්ධව පෙත්සමක් ගැසීම සම්බන්ධයෙන් සියයකට ආසන්න පිරිසක් දිවිරීමට සැලැස්වූ බවත්, එහිදී ඊට සම්බන්ධ පුද්ගලයා තම වැරැද්ද භාර ගත් බවත්, දැන ගන්නට ලැබුණි. 2011 දෙසැම්බර් මස 05 න දින සිට 10 න දින දක්වා කාලය තුළ (සඳුදා, බදාදා, සෙනසුරාදා යන කෙම්මුර දින තුන ඇතුළත) දිවිරීම සඳහා කණ්ඩායම් දෙකක් පැමිණි අතර එක් කණ්ඩායමක් සොරකමක් සම්බන්ධයෙන් ද තවත් කණ්ඩායමක් ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් ද දිවිරීමට නියමිතව තිබුණි. මෙසේ පැමිණි පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීමේ දී දැනගන්නට ලැබුණේ ඔවුන් මේ ස්ථානය පිළිබඳ දැඩි විශ්වාසයකින් පසුවන බවයි. මෙහිදී විත්තිකරුවෙකු සඳහන් කර සිටියේ තමාට සොරකමක් සම්බන්ධයෙන් අභූත චෝදනාවක් එල්ල කර ඇති බවත්, ඊට දෙවියෝ සාක්ෂි වන බවත්ය. මේ පිරිස අතර සිටි සියලු දෙනා සාමාන්‍ය මිනිසුන් බව පසක් විය. ඔවුන් එදිනෙදා කුලී වැඩ කරමින් ජීවිකාව ගෙන යන පිරිසක් බව දැන ගන්නට ලැබුණි. මෙයින් පැහැදිලිවන්නේ දිවිරීමට පෙලඹෙන්නන් ස්ථිර වශයෙන් අසවල් අසවල් සමාජ කාණ්ඩයකට හෝ ආර්ථික පසුබිමකට සීමා කිරීමට නොහැකි වන බවයි.

දිවිරීම සමාජ ප්‍රගමනයට යම් දායකත්වයක් සපයන්නේ ද යන්න විමසා බැලීම වටී. මෙයින් අදහස් වන්නේ කිසියම් ආරවුලක් සම්බන්ධයෙන් දිවිරීමට පැමිණෙන පුද්ගලයන් දිවිරීමෙන් පසු අදාළ ආරවුල විසඳෙන්නේද හා දෙපාර්ශ්වය අතර කුමනාකාරයේ එකඟතාවක් පවතින්නේ ද යන්න විමසීමයි. මෙහිදී දක්නට ලැබෙන විශේෂත්වයක් වන්නේ දිවිරීමෙන් අනතුරුව එකිනෙකා තුළ පැවති සැකය යම් ආකාරයකින් පහව යන බවයි. විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ දිවිරීමට පෙරත්, දිවිරීමෙන් පසුවත් දෙපාර්ශ්වයට ම අවවාද ලබා දෙන ආකාරය දක්නට ලැබේ. උන්වහන්සේගේ අත්දැකීමට අනුව බොහෝදෙනා එම ස්ථානයේ දී සමාදාන වී පිටව යනු ලැබේ. මේ කාරණය දෙස විමසිල්ලෙන් බැලීමේ දී පැහැදිලි වන්නේ සමාජ ප්‍රගමනයට යම් තරමකින් හෝ දායකත්වයක් සපයන බවයි. එම නිසා දිවිරීම අශිෂ්ට මිනිසුන්ගේ ක්‍රියාවකැ'යි ඉවත හෙළීමට කිසිවෙකුටත් අවකාශයක් නොලැබේ.

## නිගමනය (Conclusion)

දිවිරීම සිංහල සංස්කෘතියට ප්‍රවේශ වී වසර දහස් ගණනක් ඉක්ම ගොස් ඇත. මේ කාලවකවානුව තුළ ආගමික, සමාජ, දේශපාලනික, ආර්ථික ආදී වශයෙන් ගත් කළ මුළුමහත් සමාජ පද්ධතිය පුරාවට ම මෙම සංකල්පය පැතිර ගොස් ඇති ආකාරය දැක ගන්නට ලැබේ. ඉතා සුළු දිවිරුමකින් ආරම්භ වී ජීවිතයේ අවදානම් සහගත තත්ත්වයන් දක්වා මේ සංකල්පය වර්ධනය වී ඇත. කෙනෙකු විසින් කරන ප්‍රකාශයක සත්‍යතාව තහවුරු කිරීම දිවිරුමේ මූලික ලක්ෂණය වුවද ඊට එපිටින් දිවෙන මිනිසුන්ගේ විශ්වාස පද්ධතියේ ස්වරූපය පිළිබඳ තොරතුරු මේ තුළින් අපට දැක ගත හැකි වෙයි. ලෝකයේ සෙසු රටවල මෙන්ම ලංකාවේ ද ආදි මිනිසුන්ගේ ඇදහිලි විශ්වාස පද්ධතියේ තරම හා ඒවා ඔවුන්ගේ දායාදාකාරයෙන් පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන ආකාරයත් මේ තුළින් පැහැදිලිව අවබෝධ කරගත හැකිය.

මේ අධ්‍යයනය තුළින් අවබෝධ කරගත් කරුණක් වන්නේ දිවිරීම සාම්ප්‍රදායික ජන නීති පද්ධතිය තුළ ප්‍රධාන සංකල්පයක් ලෙස වර්ධනය වී ඇති බවයි. දිවිරීම අනුරාධපුර යුගයේ පටන් දේශීය ව්‍යවහාරය තුළ දක්නට ලැබුණු අතර පසුකාලීනව මෙය නෛතික රාමුව තුළ ද බලාත්මක වී ඇති ආකාරය දැක ගන්නට ලැබේ. සාම්ප්‍රදායික මිනිසා දිවිරීමට දැක්වූ උනන්දුව නූතනය තුළ ඒ අයුරින් ම දක්නට නොලැබුණ ද යම් තරමක නැඹුරුවක් මේ සම්බන්ධයෙන් පවතින බව දකින්නට තිබේ. පැරණි නීති ක්‍රමය තුළ මිනිසුන්ගේ විශ්වාසය දැඩිව මේ සම්බන්ධයෙන් පැවතුන ද මේ වන විට එය ඔවුන්ගේ විශ්වාසයේ ස්වරූපය මත තීරණය වී ඇති බව ද දැක ගන්නට ලැබේ.

වර්තමානයේ ලංකාවේ ක්‍රියාත්මක වන්නේ රෝම ලන්දේසි නීතියයි. මේ නීති ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක කිරීමේ දී මෙහි පැවති සාම්ප්‍රදායික ජන නීති පද්ධතිය කෙරෙහි ද අවධානය යොමු කර ඇති බව ඉංග්‍රීසීන් දිවිරීම සම්බන්ධ නීති කෙටුම්පත් සම්මත කර ගැනීම තුළින් පැහැදිලි වේ. සිංහල ගැමි ආගම තුළ දක්නට ලැබෙන සාම්ප්‍රදායික ඇදහිලි විශ්වාස අතර දෙවියන් කෙරෙහි හෝ ලෝක පාලක සොබාදහම කෙරෙහි මිනිසුන් තුළ පවත්නා විශ්වාසය සුළු කොට තැකිය නොහැකිය. එහි යම් යම් ශේෂ කොටස් නූතන කාර්මික සමාජයට ද ප්‍රවේශ වී ඇති ආකාරය සිංහල සංස්කෘතිය විමසීමෙන් පැහැදිලි වේ. එය තව දුරටත් තහවුරු කර ගත හැකි වන්නේ නූතන නීති පද්ධතිය තුළ සාම්ප්‍රදායික නීතියට ද යම් තරමක හෝ පිළිගැනීමක් ලැබී ඇති බැවිනි. මේ වන විට මේ තත්ත්වය සාම්ප්‍රදායික මිනිසුන් ජීවත් වන ප්‍රදේශවල ප්‍රබල වශයෙන් ක්‍රියාත්මක වන බව අසන්නට ලැබුණ ද ඒ පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් මෙතුළින් කිරීමට අපහසුය. කෙසේ වෙතත් ඇතැම් පුද්ගලයන් තුළ සම්මත නීති රාමුව කෙරෙහි පවත්නා විශ්වාසයට වඩා වැඩි විශ්වාසයක්

අතීතයේ සිට පැවති දිවිරීම වැනි අධිමානුෂික බලවේග පිළිබඳ පවතින බව නම් පැහැදිලිය.

අධිමානුෂික බලවේග කෙරෙහි මිනිසුන් තුළ මෙබඳු ආකාරයේ පිළිගැනීමක් පවතින්නේ කවර හෙයින් ද යන්න විමසීමෙන් පැහැදිලි වන්නේ ඔවුන්ට ව්‍යවහාරික ලෝකය තුළින් ලැබිය නොහැකි යම් යම් දෑ අධිමානුෂික බලවේග හරහා ලබාගැනීමට උත්සහ දරණ බවයි. දිවිරීමට පෙලඹෙන්නේ ඇතැම් විට සම්මත නීති රාමුව තුළින් තමාට සාධාරණයක් ඉටු නොවේ යැයි යන විශ්වාසය නිසාවෙනි. තවත් සමහරෙක් මේ සඳහා පෙලඹෙන්නේ සම්මත නීතිය තුළින් වැරදි කරුවන්ට ලැබෙන දඬුවම් ප්‍රමාණවත් නොවන නිසා අදෘශ්‍යමාන බලවිග මාර්ගයෙන් ඔවුන්ට දැඩි දඬුවම් පැමිණ වීමට ඇති බලවත් අවශ්‍යතාව හේතුවෙනි. දිවිරීමෙන් සත්‍ය අනාවරණය වූ අවස්ථා කොතෙකුත් ක්ෂේත්‍ර අධ්‍යයනයේදී දැකගන්නට හැකිවිය. එමෙන්ම බොරු දිවිරා දෙවියන්ගෙන් දඬුවම් ලැබූ පිරිස් ද දැකගන්නට ලැබුණි. කෙසේ වෙතත් ඔවුන්ට ලැබුණු දඬුවම් සත්‍ය වශයෙන් ම දෙවියන් ගෙන් ලැබුණු ඒවා ද යන්න පිළිබඳ නිශ්චිත පිළිතුරක් දිය නොහැක. මන්ද එයද පර්යේෂකයාගේ විශ්වාසය මත පදනම්ව ඇති බැවිනි.

මිනිසුන් කිසිවිටෙකත් පවත්නා පොදු නීතියට අභියෝග කිරීමට උත්සහ නොගනී. දෙවියන්ගෙන් වැඩ ගනිමින් මිනිසුන් ඉදිරියේ ශාන්තුවරයන් සේ පෙනී සිට දේව බලයෙන් අසනීප සුවකළ බොහෝදෙනා අවසානයේ රටේ පවත්නා පොදු නීතියට කොටු වී සාවද්‍ය ලෙස මුදල් ඒකරාශි කිරීමේ හා මිනිසුන් රැවටීමේ වරදට දඬුවම් ලැබූ අවස්ථා පසුගිය කාලය තුළ කොතෙකුත් අසන්නට ලැබුණි. කෙසේ වෙතත් යුක්තිය පසිඳලීමේදී නොපෙනෙන බලවේග පසුපස ගමන් කිරීමට වඩා පවත්නා පොදු නීතිය යටතේ පිළිගත හැකි සාක්ෂ්‍ය යටතේ යුක්තිය පසිඳලීම හැරුණු කොට මෙබඳු ක්‍රියා අනුමත කිරීම අපහසුය. කෙසේ වෙතත් සාමාන්‍ය පොදු නීතිය කඩකිරීමෙන් දඬුවම් ලැබෙනවාට වඩා දැඩි බියක් දෙවියන් ගෙන් ලැබෙන දඬුවම් කෙරෙහි මිනිසුන් තුළ පවතී. එය එක් අතකින් වැදගත් වෙයි. මේ විශ්වාස පද්ධතිය සමාජ පාලක උපාය මාර්ගයක් ලෙස ද ක්‍රියාත්මක බැවිනි.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*


අල්විස්, ප්‍රේමචන්ද්‍ර පරිː (2004). **තොක්ස් දුටු ලංකාව**, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

ඇල්ලේපොළ, එච්.ඇම්.සෝමරත්න, පරිː (1966). **සිංහලයේ ආණ්ඩුක්‍රමය**, (ඩොයිලි, සර් ජෝන්) ගුණසේන ප්‍රකාශනය, කොළඹ.

ගවරම්මාන, ජයතිලක (2000). **ප්‍රායෝගික නෛතික ශබ්ද මාලාව**, සමය වර්ධන ප්‍රකාශකයෝ, කොළඹ.

ගුණවර්ධන, වී.' ඩී. එස්. සංස්: (2005). **සිංහල ථූපවංශය**, සමය වර්ධන ප්‍රකාශනය, මරදාන.

ගොඩකුඹුර, චාල්ස් (1963). **කොහොඹා කංකාරිය**, රජයේ මුද්‍රණාලය, කොළඹ.

දිසානායක, ජේ. බී. (1996) **සිංහල ජන වහර**, ගොඩගේ ප්‍රකාශන, කොළඹ.

පීරිස්, රැල්ෆ් (1964). **සිංහල සමාජ සංවිධාන (මහනුවර යුගය)** සමන් මුද්‍රණාලය, මහරගම

ලියනගේ, සිරි (2000). **ජනශ්‍රැති ශබ්ද කෝෂය**, සිරිලිය ප්‍රකාශන, කොළඹ.

විමලකීර්ති, මැද උයන්ගොඩ සංස්: (1967). **ධම්පියා අටුවා ගැටපදය**, ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ.

සුමංගල නා හිමි සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ පඬිතුමා, සංස්: (1996). **සිංහල මහා වංශය**, ගොඩගේ ප්‍රකාශන, කොළඹ.

සූරවීර, ඒ. වී. සංස්: (1997). **රාජාවලිය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

රත්නපාල, නන්දසේන (2004). **"ගෝත්‍රික සමාජයේ සමාජ පාලන උපක්‍රම" මානව විද්‍යාත්මක පර්යේෂණයක් (ලිපිය)** 01-19, ඉඳුවර, පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.

**සිංහල ශබ්ද කෝෂය,** 11 වන කාණ්ඩය 31 වන භාගය (1985), සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ.

**ගුණසේන ශබ්ද කෝෂය,** (2005). ගුණසේන, ඇම්. ඩී. සමාගම කොළඹ.

**සුමංගල ශබ්ද කෝෂය** ප්‍රථම භාගය, (1963). සෝරත, වැලිවිටියේ

Brown, Lesley (1996). **The new shoter oxferd English dictioiry volum – 2,** clarendor press, London.

LIBRARY ✲ RAJARATA UNI
PERIO